# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1479/6 – 2007 ජනවාරි 09 වැනි අඟහරුවාදා – 2007.01.09

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ජෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

4 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් අමරසිංහ ආරච්චිගේ විජේපාල වන මම 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 213 වන වගන්තිය යටතේ (107) (2) (අ) වගන්තියේ කාර්යයන් සඳහා වූ සහතිකයේ ආකෘතිය මෙහි උපලේඛනයේ I වන කොටසෙහිත් එකී පනතේ 107 (2) (ආ) වගන්තිය ප්‍රකාරව ගිණුම් ප්‍රකාශයට ඇමිණිය යුතු උපලේඛනයන් මෙහි උපලේඛනයේ II වන කොටසෙහිත් නිශ්චිතව සඳහන් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමරසිංහ ආරච්චිගේ විජේපාල,<br>
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2006 දෙසැම්බර් මස 29 වැනි දින,<br>
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,<br>
කොළඹ දී ය.

උපලේඛනය

I වන කොටස

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 107 (2) (අ) වගන්තිය යටතේ අනුමත ගණකාධිකාරිවරයාගේ සහතිකය.

1.……………………………………………………………………………………………………………………මහත්වරුන්<br>
(සේවාර්ථියාගේ නම)

වෙතය.

2. වෙළඳාම/ව්‍යාපාරය /වෘත්තීය/රක්ෂාව කරගෙන යන හෝ ඒවායේ යෙදෙන අයගේ නම/නම් සහ ලිපිනය/ලිපිනයන්<br>
……………………………………………………………………………………………………………<br>
……………………………………………………………………………………………………………

3. වෙළඳාම/ව්‍යාපාරය /වෘත්තීය/රක්ෂාව කරගෙන යන හෝ ඒවායේ යෙදෙන ස්ථානය/ස්ථානයන්<br>
……………………………………………………………………………………………………………<br>
……………………………………………………………………………………………………………

4. ඇතොත්, වෙළඳාමෙහි /ව්‍යාපාරයෙහි/වෘත්තියෙහි/රක්ෂාවෙහි නාමය : ...........................................................................
..................................................................................................................................................
..................................................................................................................................................

5. වෙළඳාමෙහි /ව්‍යාපාරයෙහි/වෘත්තියෙහි/රක්ෂාවෙහි ස්වභාවය * : ..............................................................................
..................................................................................................................................................
..................................................................................................................................................

6. .............................................................. වනදායින් ආරම්භ වී ..............................................................
.............................. වනදායින් අවසන් වූ ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ ඉහත සඳහන් වෙළඳාම/ව්‍යාපාරය/වෘත්තිය/රක්ෂාව පිළිබඳ ගිණුම් ..................................................................................................................................
..................................................................................................................................................
ම විසින්/ අප විසින් පිළියෙලකරන ලදී.

7. පහත (ඇ) උපජේදයෙහි අපේ නිරීක්ෂණයට යටත්ව, මම/අපි පහත දැක්වෙන දෑ පිළිබඳව මෙයින් සහතික කරමි/කරමු.

(අ) මම / අපි

(i) පහත සඳහන් මුල් සටහන් පොත් පරීක්ෂා කර ඇත.

(ii) පහත සඳහන් අවසාන ගිණුම් පොත් පරීක්ෂා කර ඇත.

(iii) මිලට ගැනීම්, විකිණීම් සහ වියදම් මුල් මැමෝ පත්‍ර සහ වවුචරයන් සමඟ පිරික්සා/පරීක්ෂණ සෝදිසියක් කර ඇති අතර පිරික්සා නැති අතර ම විසින්/අප විසින් කරන ලද පිරික්සීමේ ස්වභාවය හා ප්‍රමාණය පහත දැක්වෙන පරිදි වේ. (විගණන මතයක් ප්‍රකාශ කර ඇති අවස්ථාවකදී මෙම විස්තර සැපයීම අවශ්‍ය නොවේ.)

(iv) බැංකු ප්‍රකාශයන්හි පෙන්නුම් කර ඇති බැංකු ශේෂයන් ගිණුම් පොත්වල පෙන්නුම් කර ඇති ඒවා සමඟ සසඳා ඇත.

(v) ණයහිමියන් සම්බන්ධව සොයා බලා ඇත./සොයා බලා නැත.

(vi) ණයකරුවන් සම්බන්ධව සොයා බලා ඇත/සොයා බලා නැත.

(ආ) ද්‍රව්‍යාත්මක තොග ගැනීම.............................. දින මගේ /අපේ අධීක්ෂණය යටතේ කරන ලදී. ද්‍රව්‍යාත්මක තොග ගැනීම.................................... අධීක්ෂණය යටතේ ............... † දින කරනු ලැබ ඇති බවට අයිතිකරු/හවුල්කරු/ අධ්‍යක්ෂ/කළමනාකරු/ විසින් සහතික කරනු ලබන අතර, එවැනි තොග ගැනීම් පිළිබඳ මට/අපට පෙන්වන ලද තොග පත්‍රිකා, එවැනි තොග ගැනීම් පිළිබඳ මුල් වාර්තා විය යුතු බවට අයිතිකරු/හවුල්කරු/අධ්‍යක්ෂ/ කළමනාකරු විසින් සහතික කරන ලද ඒවාට අනුකූල වේ.

(ඇ) බඩු තොගය /පිරිවැය/වෙළඳ අගය/නිෂ්පාදන පිරිවැය පිළිබඳ තොරතුරු අනුව, පිරිවැය/වෙළඳ අගය/නිෂ්පාදන පිරිවැය සම්බන්ධව වටිනාකම තක්සේරු කර ඇත.

(ඈ) ගිණුම්/මුදල් (වෘත්තීයකින් ලැබෙන ආදායම සම්බන්ධයෙන් පමණි)/ උපචිත වීමේ පදනමක් මත පවත්වාගෙන ගොස් ඇත.

(ඇ) අපේ තවදුරටත් වූ අදහස් දැක්වීම සහ නිරීක්ෂණයන් පහත දැක්වෙන පරිදි වේ.

..............................
අනුමත ගණකාධිකාරීවරයාගේ අත්සන.

දිනය : ..............................

* තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් නිෂ්පාදනය කරන්නේ ද යන වග සහ බඩු නිෂ්පාදනය කරන ලද්දේ ද, නැතහොත් විකුණන ලද්දේ ද, නැතහොත් සේවාවන් සපයන ලද්දේ ද, යන වග සඳහන් කරන්න.

†අයිතිකරු /හවුල්කරු/ අධ්‍යක්ෂ හෝ ඔහුගේ යම් සේවකයින් හෝ ඔබ හෝ ඔබේ යම් සේවකයින් විසින් ද යන වග සඳහන් කරන්න.

## II කොටස

(2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 107(2) (ආ) වගන්තියේ කාර්ය සඳහා නියම කර ඇත.)

### ශේෂ පත්‍රය

1. *ස්ථිර වත්කම්* – සියළු එකතු කිරීම සහ ස්ථිර වත්කම් බැහැර කිරීම් සහ බැහැර කිරීම මත ලාභය හෝ පාඩුව පිළිබඳ විස්තර සපයමින් ශේෂයන් විවෘත කිරීම සහ පියවීම සැසඳීම.

2. *සංචිතයන් සහ ප්‍රතිපාදන* – ශේෂයන් විවෘත කිරීම සහ පියවීම සැසඳීම

3. *ණය හිමියන් සහ ණයකරුවෝ* – සිය ශේෂයන් රු. 2,00,000 ඉක්මවන සියළු තැනැත්තන්ගේ නම් සහ තැපැල් ලිපිනයන්, රු. 2,00,000 ඉක්මවන ණයහිමියන් නොමැති කල්හි, විශාලතම ණයහිමියන් පස් දෙනාගේ නම් සහ තැපැල් ලිපිනයන්.

4. *ණය අත්තිකාරම් සහ ජංගම ගිණුම්*– සියළුම අධ්‍යක්ෂවරුන්, හිමිකරුවන්, හවුල්කරුවන් සහ සම්බන්ධිත සමාගම් (20% කට නො අඩු කොටස් හිමිකරුවන්, හවුල්කරුවන් හෝ සමාගම විසින් අයිතිය දරනු ලබන සමාගම් වීමෙන්) සම්බන්ධයෙන්

5. *බැංකුවෙහි ශේෂයන්* – බැංකුවේ නම, ශාඛාව සහ ගිණුම් අංක, ගිණුමේ ස්වභාවය.

### ආදායම් ගිණුම

1. *වෙනත් ආදායම්* : එය පිරිවැටුමෙන් 5% හෝ රු. 50,000 ඉක්මවන්නේ නම් විස්තර

2. *කුළී* :(බදු කුළී ඇතුළුව, එහෙත් මූල්‍ය බදු ඇතුළත් නොකොට)

(2.1) *වියදම්* : ලැබුම්කරුවන්ගේ නම් හා තැපැල් ලිපිනයන් සහ පරිශ්‍රයේ ලිපිනය සහිතව වාර්ෂික කුලිය.

(2.3) බදුකරුවන්ගේ නම් හා තැපැල් ලිපිනයන් සහ පරිශ්‍රයේ ලිපිනය සහිතව වාර්ෂික කුලිය

3. *පොලිය*

(3.1) *වියදම්* – ආදායකයන්ගේ නම් හා තැපැල් ලිපිනයන් සහ වර්ෂයකට පොලිය.

(3.2) *ලැබිය හැකි*–ණයකරුවන්ගේ නම් හා ලිපිනයන් සහ වර්ෂයකට පොලිය

4. *වාර්ෂිකයන්, බිම් කුලිය සහ පුරස්කාර* – නම් හා ලිපිනයන් සහ වර්ෂයකට ගෙවිය යුතු මුදල.

5. *සේවය සඳහා ගාස්තු* :

(5.1) *වියදම්*–වර්ෂය සඳහා එකතුව රු. 1,50,000ට අධික ගෙවීම් කළ යුතුව තිබූ තැනැත්තන්ගේ නම් සහ තැපැල් ලිපිනයන් හා සේවා ස්වභාවය.

(5.2) *ආදායම්*- වර්ෂය තුළදී එකතුව රු. 1,50,000ට අධික වූ යම් තැනැත්තන්ගෙන් ගෙවීම් ලැබිය යුතුව තිබුණේ නම් එම තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන්.

6. *ප්‍රාග්ධන ලාභ/අලාභ* –විකිණීමෙන් ලත් මුදල් /පිරිවැය 77.01.01 ට පෙර අත්කර ගත්තේ නම් එදිනට වෙළඳ අගය, විකිණීමේ වියදම් අත්කර ගැනීමේ දින සිට හෝ 1977.04.01 ට පෙර අත්කර ගත්තේ නම්, එදින සිට වැඩි දියුණු කිරීම්, අත්කර ගැනීමේ සහ බැහැර කිරීමේ දිනයන්.

7. *මූල්‍ය බදු දීම* – වත්කම් විස්තරය, අයිතිකරුගේ නම සහ තැපැල් ලිපිනය, බද්දේ ආරම්භක සහ අවසන් වීමේ දිනය, කොන්ත්‍රාත්තුව යටතේ ගෙවිය යුතු මුළු මුදල සහ වර්ෂය සඳහා ගෙවිය යුතු මුදල.

8. *කුලියට දීම හෝ බදු දීම මත වත්කම්* – වාර්ෂික ගෙවීම් රු. 25,000 ඉක්මවන කල්හි වත්කමේ විස්තරයක්, බදු දුන් තැනැත්තාගේ නම සහ තැපැල් ලිපිනය, බද්දේ ආරම්භක සහ අවසන්වීමේ දිනය, කොන්ත්‍රාත්තුව යටතේ ගෙවිය යුතු මුළු මුදල සහ වර්ෂය සඳහා ගෙවිය යුතු මුදල.

9. *කපා හරින ලද නිශ්චිතව ප්‍රතිපාදන සලසන ලද හෝ අයකර ගන්නා ලද බොල්ණය*- වෙළඳ සහ වෙනත් ණය අතර වෙනස හඳුනා ගන්න. වෙළඳ ණය සම්බන්ධයෙන්, ණයකරුවන්ගේ නම් සහ ලිපිනයන් සහ මේවා රු. 10,000ට අධික වන කල්හි කපා හරින ලද මුදල් ප්‍රමාණයන්.

10. *ඉල්ලා සිටින ලද විදේශ ගමන් වියදම්* – ගමන භාරගන්නා තැනැත්තාගේ නම සහ තනතුර වියදම් කරන ලද මුදල් ප්‍රමාණය ගිය රටවල්, ගමනට ගිය කාල සීමාව සහ ගමන් කාර්යය . (සේවා නියුක්තිකයෙකු සම්බන්ධයෙන් නම් පුහුණුව රාජකාරිවලට සම්බන්ධ වන්නේ කෙසේද යන්න දක්වන්න.)

11. *සුදුසුකම් ලබන ගෙවීම් වශයෙන් ඉල්ලා සිටින ලද පරිත්‍යාගයන්* –ආදායකයින්ගේ නම් සහ මුදල් ප්‍රමාණයන්.

12. *ගෙවිය යුතු සාමාන්‍ය පාරිතෝෂිකයන්* – සාමාන්‍ය පාරිතෝෂිකය රු. 1,00,000ට වැඩියෙන් ලබන ලැබුම්කරුවන්ගේ නම් සහ ලිපිනයන් සහ ගෙවීම් ඒකාකාර පදනමක් මත කරන ලද්දේද යන වග.

13. *පූර්ව වර්ෂයට අදාල ගැලපීම* – විස්තර

14. *ලාභාංශ*-ප්‍රකාශ කරන ලද ලාභාංශ පිළිබඳ විස්තර, ප්‍රකාශ කරන ලද දිනය සහ මේවා එදිනට ගෙවිය නොහැකි නම් ඒවා ගෙවි ය යුතු බව ප්‍රකාශ කරන ලද දිනය.

15. *විදේශ විනිමය ලාභ/අලාභ* -විදේශ විනිමය අනුප්‍රමාණ වෙනස්කම් ගිණුම්වලට බලපෑම පිළිබඳ විස්තර උපලබ්ධි වූ හා උපලබ්ධි නොවූ ලාභ/අලාභ පිළිබඳ විස්තර.

16. අදාල වර්ෂය තුළදී එකතු කළ අගය මත බදු සඳහා සපයන ලද සහ ප්‍රකාශ කරන ලද සැපයුමේ වටිනාකම සහ අදාල තුළදී ආදායම් බදු සඳහා ප්‍රකාශ කරන ලද පිරිවැටුමේ (විගණනය කරන ලද ගිණුම්වල සඳහන් පිරිවැටුම අදහස් වෙයි.) වටිනාකම සැසඳීමේ ප්‍රකාශයක්.

### සීමාසහිත වගකීම් සමාගම්

1. එක් එක් කොටස්කරු විසින් දරනු ලබන කොටස් සංඛ්‍යාව සඳහන් කරමින් ගිණුම් වර්ෂය අවසානයේ සිටි පරිදි, විශාලතම කොටස්කරුවන් පස්දෙනාගේ නම් සහ තැපැල් ලිපිනයන්.

2. සමාගමේ කළමණාකාර අධ්‍යක්ෂකගේ නම, තැපැල් ලිපිනය සහ ආදායම් බදු ලිපිගොනු අංකය.

3. උප සමාගම් පිළිබඳව හෝ වර්ෂය තුළ ගණුදෙනු කරන ලද අනෙකුත් සම්බන්ධිත සමාගම් පිළිබඳ විස්තර.

01– 392/1

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

4 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් අමරසිංහ ආරච්චිගේ විජේපාල වන මම 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 4 වන වගන්තියේ (2) ඡේදයේ අතුරු විධානයේ විධිවිධාන යටතේ 2006 අප්‍රේල් මස 01 වැනි දින සිට මෙහි උපලේඛනයේ දක්වා ඇති කිසියම් ප්‍රතිලාභයක් සඳහා අගය මෙයින් නිශ්චය කරමි.

අමරසිංහ ආරච්චිගේ විජේපාල,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2006 දෙසැම්බර් මස 29 වැනි දින,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
කොළඹ දී ය.

මෙම වගන්තියේ කාර්යයන් සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් දැනමටත් තීරණය කර ඇති කිසියම් අගයක් නොතකා,

(අ) සේවා යෝජකයා විසින් සපයනු ලබන එන්ජින් ධාරිතාව 1500 cc හෝ ඊට වැඩි යම් මෝටර් වාහනයක් පුද්ගලිකව පාවිච්චි කිරීමේ අගය මසකට රුපියල් පහළොස් දහසක් සේ සැලකිය යුතුය.

සේවා යෝජකයා විසින් සපයනු ලබන එන්ජින් ධාරිතාව 1500 cc ට අඩු යම් මෝටර් වාහනයක් පුද්ගලිකව පාවිච්චි කිරීමේ අගය මසකට රුපියල් හත් දහස් පන්සීයයක් සේ සැලකිය යුතුය.

සේවා යෝජකයා විසින් සපයනු ලබන මෝටර් සයිකලයක් පුද්ගලිකව පාවිච්චි කරයි නම් අගය මසකට රුපියල් දෙදහසක් සේ සැලකිය යුතුය.

(ආ) ඉන්ධන වියදම සේවා යෝජකයා විසින් දරනු ලබන සේවකයාට අයත් යම් මෝටර් රථයක්/ එන්ජින් ධාරිතාව නොතකා/පුද්ගලිකව පාවිච්චි කිරීමේ අගය මසකට රුපියල් පන්දහසක් සේ සැලකිය යුතුය.

ඉන්ධන වියදම් සේවා යෝජකයා විසින් දරනු ලබන සේවකයාට අයත් යම් මෝටර් බයිසිකලයක් පුද්ගලිකව පාවිච්චි කිරීමේ අගය මසකට රුපියල් හත්සීය පනහක් සේ සැලකිය යුතුය.

(ඇ) සේවා යෝජකයා විසින් නිවැරදි ගමනාගමන සටහන් පවත්වාගෙන යනු ලබන යම් වාහනයක් එන්ජින් ධාරිතාවය නොතකා පුද්ගලිකව පාවිච්චි කිරීමේ අගය කිලෝමීටරයකට රුපියල් පහළොවක් සේ සැලකිය යුතුය.

සේවා යෝජකයා විසින් නිවැරදි ගමනාගමන සටහන් පවත්වාගෙන යනු ලබන, යම් මෝටර් බයිසිකලයක් පුද්ගලිකව පාවිච්චි කිරීමේ අගය කිලෝමීටරයකට රුපියල් තුනක් සේ සැලකිය යුතුය.

(ඈ) සේවකයාට අයත් යම් මෝටර් රථයක් හෝ මෝටර් බයිසිකලයක් නඩත්තු කිරීම වෙනුවෙන් යම් සත්‍ය වියදමක් සේවා යෝජකයා විසින් ප්‍රතිපූර්ණය කරන විටකදී අදාළ ප්‍රතිලාභයේ අගය සේවා යෝජකයා විසින් ප්‍රතිපූර්ණය කරන ලද සත්‍ය වියදම් විය යුතු ය.

01 – 392/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.